# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 7 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව | ඒකකය: 1 - අප ජීවත් වන පෘථිවි ගෝලය |
|---|---|---|

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- වඩාත් ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

01) පෘථිවි භ්‍රමණ කාලය

1) පැය 25 2) පැය 24 3) දින 365 4) දින 24

02) පෘථිවියේ ආදර්ශ ගෝලයේ ප්‍රධාන අක්ෂාංශය.

1) කර්කටක නිවර්තනය 2) මධ්‍ය දේශාංශය
3) ආක්ටික් වෘත්තය 4) සමකය

03) පෘථිවි ගෝලයේ පිහිටි සාගර සංඛ්‍යාව

1) හයකි 2) පහකි 3) හතකි 4) අටකි

04) පෘථිවියේ ආදර්ශ ගෝලයේ නැගෙනහිර සිට බටහිරට තිරස් අතට විහිදෙන රේඛා

1) දේශාංශ නම් වේ 2) අක්ෂාංශ නම් වේ
3) පරිධිය නම් වේ 4) විෂ්කම්භය නම් වේ

05) යුරෝපා මහාද්වීපයට අයත් රටක් වන්නේ,

1) ශ්‍රී ලංකාව 2) ප්‍රංශය 3) මැඩගස්කරය 4) සුඩානය

- යා කරන්න.

**පහත සඳහන් රටවල් අයත්වන මහාද්වීපය තෝරා යා කරන්න.**

| | රටවල් | මහාද්වීපය |
|---|---|---|
| 06) | චීනය | යුරෝපා මහාද්වීපය |
| 07) | කියුබාව | උතුරු ඇමරිකා මහාද්වීපය |
| 08) | නවසීලන්තය | ආසියා මහාද්වීපය |
| 09) | ලිබියාව | ඕස්ට්‍රේලියා මහාද්වීපය |
| 10) | නෝර්වේ | අප්‍රිකා මහාද්වීපය |

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk

- **පහත වාක්‍ය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

11) ටෝකියෝ නගරය චීනය තුළ පිහිටා ඇති නගරයකි. ( )

12) බ්‍රසීලය උතුරු අර්ධගෝලය තුළ පිහිටි රටකි. ( )

13) අංශක 0 දේශාංශය මගින් පෘථිවිය උතුරු හා දකුණු අර්ධ ගෝල දෙකකට බෙදී යයි. ( )

14) ග්‍රීන්ලන්තය ලොව විශාලතම දූපතයි ( )

15) අත්ලන්තික් සාගරයේ විශාලත්වය වර්ග කිලෝමීටර් 77 ක් පමණ වේ. ( )

- **කෙටි නිශ්චිත පිළිතුරු සපයන්න.**

16) ලොව විශාලතම මහාද්විපය .............................................

17) අභ්‍යන්තර මුහුදකි. .............................................

18) පෘථිවි පෘෂ්ඨයේ ජලයෙන් වැසී ඇති ප්‍රතිශතය .............................................

19) සැන්ප්‍රැන්සිස්කෝ නගරය අයත් රට .............................................

20) මහාද්වීපයක් වූ තනි රටකි. .............................................

## II පත්‍රය

(01)

i. පෘථිවි භ්‍රමණය යනු කුමක් ද?
11 පෘථිවි පරිභ්‍රමණය කෙටියෙන් හඳුන්වන්න.
111 අධික අවුරුද්දක් සකස් වන ආකාරය කෙටියෙන් පහදන්න.

(02)

i. පෘථිවිය ගෝලාකාර වස්තුවක් බව ඔප්පු කිරීමට යොදාගත හැකි සාක්ෂි 2ක් නම් කරන්න.
11 ''පෘථිවිය යනු පූර්ණ ගෝලයක් නොවේ'' එය සනාථ කිරීමට සාක්ෂි 2ක් ඉදිරිපත් කරන්න.
111 සුදුසු පිළිතුර ලියන්න.

1. සමක පරිධිය : ..................................................................
2. ධ්‍රැව පරිධිය : ..................................................................
3. සමක විෂ්කම්භය : ..................................................................
4. ධ්‍රැව විෂ්කම්භය : ..................................................................

(03)

i. අක්ෂාංශ යනු මොනවා ද?
ii. දේශාංශ යනු මොනවා ද?
iii. ආදර්ශ ගෝලයේ දක්නට ලැබෙන ප්‍රධාන අක්ෂාංශය හා දේශාංශය නම් කරන්න.

(04)

i. අංශක 180 දේශාංශය සෘජු රේඛාවක් ලෙස ඇඳ නැත්තේ කුමන හේතුව නිසා ද?

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

ii. ප්‍රධාන අක්ෂාංශය හැරුණු විට ආදර්ශ ලෝක ගෝලයේ දක්නට ලැබෙන වෙනත් ප්‍රධාන අක්ෂාංශ 04ක් නම් කරන්න.

iii. මහද්වීප යනු මොනවා ද?

(05)

i. මහද්වීප 07 ආදර්ශ ලෝක සිතියමක ලකුණු කොට නම් කරන්න.

ii. දූපතක් යනු කුමක් ද?

iii. ලොව පිහිටා ඇති විශාල දූපත් 05 ක් නම් කරන්න.

(06)

i. සාගර යනු මොනවා ද?

ii. ලෝකයේ දක්නට ලැබෙන සාගර 05 නම් කරන්න.

iii. සාගරයක් හා මුහුදක් අතර ඇති වෙනස කුමක් ද?

(07)

i. ලොව දක්නට ලැබෙන
   a. අභ්‍යන්තර මුහුදු 03 ක්
   b. සාගරයට සම්බන්ධ මුහුදු 03 ක් නම් කරන්න.

ii. ශ්‍රී ලංකාවේ අයත් වන සාගරය හා මහද්වීපය ලියා දක්වන්න.
   a. සාගරය : ..................................................................
   b. මහද්වීපය : ..................................................................

iii. ශ්‍රී ලංකාවට වයඹ දෙසින් පිහිටා ඇති දූපත් 03 ක් නම් කරන්න.

iv. පහත දැක්වෙන ප්‍රදේශවල දක්නට ලැබෙන වෘක්ෂලතා වර්ග ලියා දක්වන්න.

1. තෙත් කලාපය
2. වියළි කලාපය
3. කඳුකර ප්‍රදේශය
4. සානු ප්‍රදේශ
5. අර්ධ ශුෂ්ක ප්‍රදේශ
6. වෙරළබඩ ප්‍රදේශ

**සැකසුම : නිසංසලා ගලප්පත්ති මිය**



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!